DOI: https://doi.org/10.4038/jdrra.v3i1.68

*The Journal of Desk Research Review and Analysis, Vol. 3, Issue 1, 2025, 11-24*

# AN INVESTIGATIVE STUDY OF THE THEORIES SURROUNDING THE STANDING BUDDHA STATUE AT THE POLONNARUWA ROCK TEMPLE

MPR Medage[1]

***Abstract***

It can be recognised from the literary evidence that Buddha statues were created from the time when Buddha was alive. However, the oldest archaeological evidence is considered to be the Buddha image created on a gold coin during the reign of King Kanishka. After that, the Buddha statue began to spread throughout the entire island of Sri Lanka. After the Anuradhapura period, Buddha statue art also became popular in the Polonnaruwa period, and the Buddha statues in the rock temple can be recognised as its peak. Polonnaruwa Gal Vihara, the standing Buddha statue, has a special place. The unique and different features present in the variations of the image here were the reason for this. There has been a theory that a Buddha statue, a statue of Ananda Thero, has been published. Since the mudra of the statue is not commonly used for other statues, it has attracted special attention. Although this mudra is primarily known by the name Paradukkha Dukkhitha, various scholars have expressed different opinions about this mudra. It has also been called by the names Animisa Lochana, Swastika, and Avadhana. The main objectives of this research are to study the meanings expressed in the theories about this mudra. The theories about this mudra have been studied through secondary sources. Literature itself has been the main factor in various scholars presenting their theories about this statue. According to the facts mentioned in Buddhist literature, theories have been expressed about the posture of this statue and the mudra. In general, the statue has been created with three primary meanings. That is, it depicts the second week of the Seven Weeks after the Enlightenment, the Animisa Locana Puja, the Depiction of Ananda Thero, the Great Passing Away of Buddha (Parinirvana), and the Buddha's compassionate gaze on the beings of the world. The form in which the Buddha looks with compassion towards the beings of the world. It can be confirmed that this statue is a statue of the Buddha in a standing posture.

***Keywords:*** Gal Vihara, Ideology, Iconography, Buddha Statue, Mudra

---

[1]Department of Fine Arts, University of Kelaniya, Sri Lanka.

Email: Palindarasangith1992@gmail.com https://orcid.org/0009-0009-5893-8310

The Journal of Desk Research Review and Analysis © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 27.04.2025 Accepted date: 04.07.2025
Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

*The Journal of Desk Research Review and Analysis, Vol. 3, Issue 1, 2025, 11-24*

# පොළොන්නරුවේ ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳව ඇති මතවාද පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.පී.ආර්. මැදගේ

***සාරසංක්ෂේපය***

බුදුන් ජීවමානව වැඩ සිටි සමයේ සිටම බුද්ධ ප්‍රතිමා නිර්මාණය වූ බව සාහිත්‍යයම සාධක ඇසුරෙන් හඳුනාගත හැකිය. නමුත් පුරාවිද්‍යාත්මක පැරණිතම සාධකය ලෙස සලකනු ලබන්නේ කනිෂ්ක රාජ සමයේ දී රන් කාසියක නිර්මාණය වූ බුද්ධ රූපයයි. මෙලෙස ආරම්භ වූ බුද්ධ ප්‍රතිමා කලාව ශ්‍රී ලංකාවේ දී ආරම්භ වී ව්‍යාප්ත වීම සිදුවිය. අනුරාධපුර යුගයෙන් පසුව පොළොන්නරු යුගයේ දී ද බුද්ධ ප්‍රතිමා කලාව ජනප්‍රිය වූ අතර එහි උච්චතම අවස්ථාව ලෙස ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමාවන් හඳුන්වා දිය හැකිය. එයිනුත් හිටි බුද්ධ ප්‍රතිමාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙහි රූපභේදයන්හි පවතින සුවිශේෂී අනන්‍ය වූ ලක්ෂණ එයට හේතු විය. ගල් විහාරයේ හිටි ප්‍රතිමාව මඟින් බුද්ධ ප්‍රතිමාවක් හෝ ආනන්ද හිමියන්ගේ ප්‍රතිමාවක් ලෙස පර්යේෂකයින් විසින් මත පළ කර ඇත. ප්‍රතිමාවේ මුද්‍රාව වෙනත් ප්‍රතිමා සඳහා සුලභව භාවිත නොවීම මත එයට විශේෂ අවධානයක් යොමු විය. පරදුක්ඛ දුක්ඛිත යන නාමයෙන් මූලික වශයෙන් මෙම මුද්‍රාව හඳුන්වනු ලැබුව ද, විවිධ විද්වතුන් විසින් මෙම මුද්‍රාව පිළිබඳ විවිධ මත ප්‍රකාශයට පත් කර ඇත. අනිමිසලෝචන, ස්වස්තික සහ අවධාන යන නාමයන් ගෙන් ද හඳුන්වා ඇත. මෙම මුද්‍රාව පිළිබඳ පළකර ඇති මතවාදයන්හි ප්‍රකාශිත අර්ථයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු ලෙස දැක්විය හැකිය. ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ මෙම මුද්‍රාව පිළිබඳ ඇති මතවාද අධ්‍යයනය කිරීම සිදුකර තිබේ. විවිධ විද්වතුන් විසින් මෙම පිළිමය පිළිබඳ තම මතවාදයන් ඉදිරිපත් කිරීමට මූලිකවම හේතු සාධකය ලෙස සාහිත්‍යයම සාධක බලපෑ ඇති බව පැහැදිලි ය. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් කරුණු උපුටා ගනිමින් ඒ අනුව මෙම ප්‍රතිමාවේ ඉරියව්ව, මුද්‍රාව පිළිබඳව මතවාදයන් දක්වා ඇත. පොදුවේ ප්‍රධාන අර්ථ තුනකින් ප්‍රතිමාව සඳහා අර්ථ ලබා දී ඇත. එනම් බුද්ධත්වයෙන් පසුව සත්සතියේ දෙවන සතිය වූ අනිමිසලෝචන පූජාව නිරූපණය සහ බුද්ධ පරිනිර්වාණයෙන් ශෝකයට පත් ආනන්ද තෙරුන් නිරූපණයක් ලෙස සහ බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයින් කෙරෙහි කරුණාවෙන් යුක්තව බලන ස්වරූපය නිරූපණය කළ බව ය. මෙම ප්‍රතිමාවෙන් බුද්ධ රූපයකට අන්‍යය වූ රූපභේද හඳුනාගත හැකි බැවින් මෙම ප්‍රතිමාව බුදුරාජණන් වහන්සේගේ හිටි ඉරියව්වෙන් යුක්ත ප්‍රතිමාවක් බව තහවුරු කර ගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** ගල් විහාරය, මතවාද, රූපභේද, බුද්ධ ප්‍රතිමා, මුද්‍රාව

**හැඳින්වීම**

බුදුරජාණන් වහන්සේව මානව රූපකායෙන් දැක්වීම කිනම් ප්‍රදේශයක, කිනම් කාලපරිච්ඡේදයක ආරම්භ වූවාදැයි නිශ්චිත නිගමනයකට එළඹීමට තවමත් හැකියාව නොමැත. සාහිත්‍යමය සහ පුරාවිද්‍යාත්මක සාධක අතර පරස්පරතාවයන් බහුලව දැකගත හැකිය. බුද්ධ ප්‍රතිමාව කවදා, කෙසේ නිර්මාණය වූව ද යන්න නිශ්චිත නොමැති වූවත්, ක්‍රිස්තු වර්ෂ 01වන සියවසේ සිට ඉන්දියාව, ශ්‍රී ලංකාව ඇතුළු බුද්ධාගම පැවති රාජ්‍යයන් මූලික කර ගනිමින් නිර්මාණය වූ බවට සාධකයන්ගෙන් තහවුරු වන්නේ ය. අනුරාධපුර යුගයේ දී ආරම්භ වූ මෙරටට බුද්ධ ප්‍රතිමා නිර්මාණය පොළොන්නරුවට පසුව රාජධානිය මාරු වූව ද, නොකඩවා ම නිර්මාණය වීම සිදුවිය. පොළොන්නරු යුගයේ නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමාවන්හි උච්චතම අවස්ථාව ලෙස ගල් විහාරය හෙවත් උත්තරාරාමයේ බුද්ධ ප්‍රතිමා පෙන්වා දිය හැකිය. මෙම ප්‍රතිමා හිඳි බුද්ධ ප්‍රතිමා ද්විත්වයකින්, හිටි බුද්ධ ප්‍රතිමාවකින් සහ සැතපෙන බුද්ධ ප්‍රතිමාවකින් සමන්විත වන්නේ ය. මෙම ප්‍රතිමා අතුරින් වැඩිම මතවාදයන්ට, සාකච්ඡාවන්ට භාජනය වූ ප්‍රතිමාව වූයේ හිටි බුද්ධ ප්‍රතිමාවයි.

මෙම ප්‍රතිමාව අනෙකුත් හිටි ප්‍රතිමාවන් සමඟ සංසන්දනය කිරීමේ දී ඉරියව්ව ආභංග හැඩයෙන් ද, මුද්‍රාව ලෙස දැත් පපුව ආසන්නයේ එකිනෙක බැඳ ඇති ස්වරූපයෙන් යුතුව ද, හඳුනාගත හැකිය (ඡායාරූපය 02). මෙවැනි ප්‍රතිමා ලංකාවේ ඉතාමත් විරලවන අතර දනට මෙවැනි ප්‍රතිමා 09ක පමණ සාධක හඳුනාගෙන ඇත. එයිනුත් දනට අංග සම්පූර්ණව සංරක්ෂිතව ඇති පැරණිතම සහ විශාලතම ප්‍රතිමාව වන්නේ මෙම ගල් විහාරයේ ප්‍රතිමාවයි. මෙම නිසා මෙම ප්‍රතිමාව පිළිබඳ පළ වී ඇති අදහස් විවිධාකාර වන්නේ ය. මෙම පර්යේෂණයේ මූලික අරමුණුවන්නේ එම මතවාද පිළිබඳව වර්තමාන අධ්‍යයනයන්ගෙන් නැවත පර්යේෂණයට ලක් කිරීමයි. පර්යේෂණ ගැටළුව වන්නේ මෙම පිළිමයේ රූපභේද පිළිබඳව පළකර ඇති අදහස් කොතරම් දුරට පිළිමයේ දකගත හැකි රූපභේදයන් සමඟ සමානුපාතික වන්නේ ද ? යන්න ය. මෙම පර්යේෂණයෙන් වර්තමාන සාධක සමඟ කෙතරම් දුරට මෙම මතවාදයන් නිවැරදිවන්නේ ද නොවන්නේ ද යන්න අධ්‍යයනය කර ඇත. මෙම ප්‍රතිමා පිළිබඳ මතවාදයන් පළ කරන අවස්ථාවේ දී අනෙකුත් මෙම රූපභේදයන්ට සමාන පිළිම පිළිබඳ වූ සාධකයන් කිහිපයක් හඳුනාගෙන ඇති නමුත් ඒවා පිළිබඳ අධ්‍යයනය කර නොමැති බව පැහැදිලි ය. පසුකාලීන පර්යේෂණයන්ගෙන් කෙතරම් දුරට මෙම රික්තකය සම්පූර්ණ වී ඇත් ද යන්න අධ්‍යයනය කර ඇත.

මෙම පර්යේෂණයේ දී ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව මූලිකව අධ්‍යයනය කරන ලදී. එසේම මෙම පිළිමයේ රූපභේදවලට සමාන යටාල වෙහෙර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පිළිමය, පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පිළිමය, පොළොන්නරුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ පිළිමය, පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ප්‍රතිමාව, හිඳගල ලෙන් විහාර හිටි බුද්ධ ප්‍රතිමාව, දඹුල්ල මහාරාජ ලෙනහි ඇති හිටි බුද්ධ ප්‍රතිමාව, නියඳවනය පුරාණ රජමහා විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව, කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති සියම් ලෝකඩ බුද්ධ ප්‍රතිමාව, රිටිගල හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳව ද දළ වශයෙන් අධ්‍යයනය කර ඇත. ඊට අමතරව මෙම ස්වරූපයේ බුද්ධ රූප සහිත සිතුවම් සහිත උඩුනුවර ලංකාතිලක රජමහා විහාරය, හිඳගල රජමහා විහාරය, වාලවෙල පමුණුව පුරාණ ටැම්පිට විහාරය, බඹරගල රජමහා විහාරය, දඹුල්ල රජමහා විහාරය, මැදවල ටැම්පිට විහාරය, දෙගල්දොරුව රජමහා විහාරය, රිදී විහාරය, රුස්වෙහෙර පුරාණ රජමහා විහාරය, යාපහුව රජමහා විහාරය, පොතුහැර අල්ගම ශ්‍රී සංඝරාජ රජමහා විහාරය, බුලුවල ඓතිහාසික සැඟැලෙන රජමහා විහාරය, ඊතනවත්ත මැද්දේගොඩ පුරාණ ටැම්පිට විහාරය, බුදුගේහින්න නාග රජමහා විහාරය, ලේවැල්ලේ ගංගාරාම රජමහා විහාරය, හතරලියැද්ද දුංකුඹුර පුරාණ ටැම්පිට විහාරය, අස්ගිරිය රජමහා විහාරය, පොළොන්නරුව තිවංක පිළිමගෙය, නියඳවනය පුරාණ රජමහා විහාරය, බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් පිළිබඳව ද අධ්‍යයනය කර ඇත.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් ද්විතීක මූලාශ්‍ර ඔස්සේ පළ වී ඇති මතවාදයන් පිළිබඳව අධ්‍යයනය කර ඇත. මේ සඳහා පොත්, පර්යේෂණ සඟරා, පර්යේෂණ ලිපිවල අන්තර්ගත කරුණු පිළිබඳව වැඩි අවධානය යොමුකර ඇත. එසේම නියැදි ස්ථානයන්හි ක්ෂේත්‍ර අධ්‍යයනයන් ද යොද ගන්නා ලදී. විහාරාධිපතිවරුන්ගෙන්, පුරාවිද්‍යා නිලධාරීන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගනිමින් අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගැනීම සිදුකරන ලදී.

**ප්‍රතිඵලය**

**බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ඉතිහාසය**

බුදුන් ජීවමානව වැඩ සිටින කාලපරිච්ඡේදයේ දී ම බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය වූ බව කෝසල බිම්බ වර්ණනාවේ සඳහන් වේ (ආරියපාල, 2008). කෝසල බිම්බ වර්ණනාව ආරම්භයේ දී පාලි භාෂාවෙන් රචනා වී පසුව සිංහල භාෂාවෙන් වර්ණනාත්මකව රචනා කෙරෙන්නට ඇති බව පැහැදිලි ය. කෝසල බිම්බ වර්ණනාව භාරතයේ ප්‍රභවය වී මහායාන භික්ෂූන් වහන්සේලා විසින් මෙරටට රැගෙන පැමිණෙන්නට ඇති බවත්, වාචිකව පැවති එම දේශනාවන් දේශීයව රචනා වූ බව හඳුනාගත හැකිය. පාලි සහ සිංහල භාෂාව රචනා වූ ස්වරූපය අනුව පැහැදිලි වන්නේ කෝසල බිම්බ වර්ණනාව මහනුවර යුගයේ දී රචනාවන්නට ඇති බව ය. මෙම කෘතියේ කර්තෘ පිළිබඳ සඳහනක් නොවන අතර මෙහි අන්තර්ගත කරුණු වූයේ බුදුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයේ දී පසේනදී කෝසල මහරජතුමා විසින් බුදුන් වහන්සේගේ අවසරයේ ඇති ව සඳුන් හරයකින් ජීවමාන ප්‍රමාණයේ බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීම ඇතුලත් කතා පුවත ය.

> රජ්ජුරුවෝ සියල්ලම බුදුන් අතින් අසා පිළිම කරවීමෙහි ආනිශංස දැන පිළිම කරවීමට අවකාශ ලදීන් හුන් තැනින් නැඟී සිට ගොසින් බුදුන්ට වැඳ අවකාශ ගෙන පිරිවර හා සමග රජ ගෙට ගොසින් තමන්ගේ භාණ්ඩාගාරයෙන් මහත් සඳුන් හරයක් ගෙන්වා ගෙන ඒ සඳුන් හරින් සලක්ෂණකොට පිළිමයක් කරවා ලක්ෂා රසයෙන් පොවන ලද මාහැඟි කසා වස්ත්‍රයක් පොරවා නිලකොට තබාලූහ. ඒ පිළිමය සජීවී බුදු කෙනකුන් මෙන් උපමා රහිතව බලන්නවුන්ට ඉතා ආශ්චර්යය වූයේ ය (පියදස්සි සහ ගුණසිංහ, 2017, පි. 39-40).

මීට අමතරව තවත් බෞද්ධ මූලාශ්‍ර කිහිපයක බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වීම ගැන සඳහන් කර ඇත. දැනට පුරාවිද්‍යාත්මක හමු වී ඇති පැරණිතම බුද්ධ රූපය අපට හඳුනාගත හැකි වන්නේ ක්‍රිස්තු වර්ෂ 128 - 150 අතර පළමු වන කනිෂ්ක රජුගේ කාලයේ දී නිර්මාණය කරන ලද රන් කාසියකිනි (ඡායාරූපය 01). මෙම කාසියේ ඉදිරිපස මුහුණතේ කිරුළ පැළඳ සිටින කනිෂ්ක රජු වමතින් හෙල්ලය දරා සිටින අතර කාසියේ පිටත වටයේ þAONANOþAO KA ... NηþKI KOþANO (රජවරුන්ගේ රජු කණිෂ්ක කුෂාන්) ලෙස සඳහන් කර ඇත. කාසියේ අනෙක් මුහුණතහි බුදුන් වහන්සේ හිටි ඉරියව්වෙන් යුක්තවන අතර, වමතින් සිවුර දරා, දකුණු අත අභය මුද්‍රාවෙන් යුක්තව නිරූපිත ය. වම්පසින් BOΔΔO (බුද්ධ) ලෙස සඳහන් කර ඇත.



**ඡායාරූපය 01ඃ කනිෂ්ක යුගයේ නිර්මිත රත්‍රං කාසිය, ක්‍රිස්තු වර්ෂ 128-150, කාසියේ බර ග්‍රෑම් 7.93, විෂ්කම්භය මිලී මීටර් 20, ආහින් පොෂ් ස්තූප (Ahin Posh) භූමියෙන් සොයා ගන්නා ලදි, බ්‍රිතාන්‍ය කෞතුකාගාරය, ලන්ඩන්.**

දේශීය සාහිත්‍යය මුලාශ්‍ර අධ්‍යයනයේ දී බුද්ධ ප්‍රතිමාවේ නිර්මාණය පිළිබඳ අදහස් කිහිපයක් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ප්‍රථම බුද්ධ ප්‍රතිමාව පිළිබඳ මහාවංශයේ සඳහන් කරුණු පිළිබඳ මතවාදයන් පවති. ක්‍රිස්තු වර්ෂ 266 - 276 අතර කාලයේ දී පළමුවන ජෙට්ඨතිස්ස රජු විසින් දේවානම්පියතිස්ස රජු විසින් ථූපාරාමයට කරන ලද මහ ගල් පිළිමය පාචීනතිස්ස පබ්බතාරාමයට වැඩමකළ බව සඳහන් වේ.

> ඒ දෙටුතිස් රජ දෙවනපෑතිස් රජු විසින් පෙර ථූපාරාමයෙහි පිහිටු වන ලද මනා දැකුම් ඇති මහ ගල් පිළිමය ථූපාරාමයෙන් ගෙණ ගොස් පැදුම් තිස් පව් අරම්හි පිහිට විය (විමලජොති, 2003, පි. 161).

නමුත් දේවානම්පියතිස්ස රජු පිළිබඳ මහාවංශ විස්තරයේ දී මෙම බුද්ධ ප්‍රතිමාව පිළිබඳ සඳහන් නොවෙයි. මහා වංශයේ ප්‍රථමයෙන් ම බුද්ධ ප්‍රතිමාවක් පිළිබඳ සඳහන් වන්නේ දුටුගැමුණු රාජ්‍ය සමයේ දී ය.

> බෝධිය නැගෙණහිරින් පණ වන ලද අනර්ඝ පයඞ්කරයෙහිත් භාස්වර වූ රන් මුවා බුදු පිළිමයක් හිඳු විය (විමලජොති, 2003, පි. 126).

දුටුගැමුණු රජු විසින් මහා ථූපයේ ධාතු ගර්භයේ ස්වර්ණ බුදු පිළිමයක් තැන්පත් කළ බව සඳහන් වන්නේ ය. මෙයින් අනතුරුව වංශ කතාවන්හි විවිධ අවස්ථාවල දී බුද්ධ ප්‍රතිමා නිර්මාණය පිළිබඳව සාධකයන් හඳුනාගත හැකිය. පුරාවිද්‍යාත්මක මෙරටින් හමු වූ පැරණිතම බුද්ධ ප්‍රතිමාව පිළිබඳව විවිධ මතවාදයන් පවතී. මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ට අනුව මෙරටින් හමු වූ පැරණිතම බුද්ධ ප්‍රතිමාව ලෙස මහඉලුප්පල්ලමෙන් හමු වූ හිටි බුද්ධ ප්‍රතිමාව දක්වයි. මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මෙරටින් හමු වූ පැරණිතම ප්‍රතිමාව ලෙස සලකනු ලබන්නේ අනුරාධපුර අභයගිරියේ ආසනඝරයෙන් හමු වූ හිඳි බුද්ධ ප්‍රතිමාවයි (වික්‍රමගමගේ, 2006).

බුදු පිළිමය කවදා කෙසේ නිර්මාණය වීම සිදු වුව ද, වර්තමානයවන විට දී, එය ඉතා ජනප්‍රිය කලා කර්මාන්තයක් බවට පත්ව තිබේ. බුදු පිළිමයක් නිර්මාණය කිරීමේ දී එයට විශේෂිත වූ නීතිරීති මාලාවක් භාවිත කරනු ලබයි. බෞද්ධ සූත්‍රයන්හි බුද්ධ ශරීරය පිළිබඳව පැහැදිලිව සඳහන් කර ඇත. බුද්ධ ශරීරයේ මහා පුරුෂ ලක්ෂණ පිළිබඳව බ්‍රහ්මායු, මහාපදාන සහ ලක්ඛණ යන සූත්‍රයන්හි සඳහන් කර තිබේ. මහා පුරුෂ ලක්ෂණ තිස් දෙකට අමතරව අනුව්‍යඤ්ජන අසූවක් ද, මගුල් ලක්ෂණ 108ක් ද, ව්‍යාමප්‍රභා, රංසිජාල හා කේතුමාලා යන ලක්ෂණවලින් බුද්ධ ශරීරය සමන්විතවන බව සඳහන් කරයි (උපරතන, 2011). නමුත් මෙම සියලුම ලක්ෂණ බුද්ධ ප්‍රතිමාවකින් නිරූපණය කිරීමට හැකි නොවීය. බුදු පිළිමයකට ඇතුළත් කළ හැකි උපරිම ලක්ෂණ ප්‍රමාණයක් යොදා ගන්නා ලදී. පැරණි බුදු පිළිම අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිවන කාරණය නම් ශිල්පීන් විසින් නිශ්චිත ලක්ෂණ ප්‍රමාණයක් බුද්ධ ප්‍රතිමාවට එක්කර ඇති බව ය. එහි ප්‍රතිඵලය වූයේ එලෙස බුද්ධ ප්‍රතිමාවට භාවිත වූ ලක්ෂණ නියතයක් ලෙස පසුකාලීනව ප්‍රතිමා නිර්මාණයේ දී භාවිත වීම ය.

එසේම බුද්ධ ප්‍රතිමාවක් නිරූපණයේ දී බුද්ධ ශරීරයේ ලක්ෂණවලට අමතරව ආසනය, ඉරියව්ව, මුද්‍රාව සහ චීවරය යන අංග ද, යොදා ගනු ලැබීය. මෙම අංගවලින් මුද්‍රාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. බුද්ධ ප්‍රතිමාවෙන් නිරූපිත අවස්ථාව අවබෝධ කරගැනීමට මෙම මුද්‍රාව උපකාරී වේ. මුද්‍රාවෙන් ප්‍රතිමාවක ලාංඡනය, හැඟවීම, සංඥාව යන අර්ථය ලබාදේ. ප්‍රතිමාවක මුද්‍රාව නිරූපණය කිරීම දෙයාකාර ය. එනම් ප්‍රතිමාවක අතෙහි ඇඟිලිවලින් නිරූපිත මුද්‍රාවන් සහ ප්‍රතිමාවක අතට ගත් ආයුධ සහිත නිරූපිත මුද්‍රාවන් වේ. ඉහත ක්‍රමවලින් බුද්ධ ප්‍රතිමාවක් සඳහා ඇඟිලිවලින් නිරූපිත මුද්‍රා ක්‍රමය භාවිත කරනු ලබයි (ධම්මදස්සි, 2010).

ප්‍රතිමාවෙන් ප්‍රතිමාවට මෙම මුද්‍රාව වෙනස්වන අතර එමඟින් ප්‍රතිමාව හඳුනා ගැනීමට ඇති විශේෂ ලක්ෂණය ද වන්නේ ය. එසේම හිටි බුද්ධ ප්‍රතිමාවලට අවේණික මුද්‍රාවන් වෙනම ද, හිඳි බුද්ධ ප්‍රතිමා සඳහා භාවිත මුද්‍රා වෙන වෙනම ද භාවිත විය. දේශීය බුද්ධ ප්‍රතිමාව නිරූපණය කිරීමේ දී ප්‍රධාන වශයෙන්ම ධ්‍යාන, අභය, වරද, භූමිස්පර්ශ, පරදුක්ඛ දුක්ඛිත සහ විතර්ක යන මුද්‍රා බහුලව භාවිත කර ඇත. මෙම කැපී පෙනෙන මුද්‍රාවන්ට අමතරව තවත් මුද්‍රා ගණනාවක්ම ප්‍රතිමාවලින් හඳුනාගත හැකිය.

**පොළොන්නරුව ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව**

පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව සම්බන්ධයෙන් දැනට ලංකාවෙන් හමු වී ඇති සුප්‍රසිද්ධම බුද්ධ ප්‍රතිමාව වන්නේ ගල් විහාරය හිටි බුද්ධ ප්‍රතිමාව ය (ඡායාරූපය 03). එසේම මෙම ප්‍රතිමාව දැනට ලංකාවෙන් හමු වූ මෙම මුද්‍රාව පැහැදිලිව හඳුනාගත හැකි විශාලම ප්‍රතිමාවයි. ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසට අයත් ප්‍රතිමාව පිහිටි පර්වතයක ආබද්ධව නිර්මාණය කර ඇත. අඩි 80 පමණ දිගැති සහ අඩි 30 ක් පමණ උස ඇති පිහිටි පර්වතයක ප්‍රතිමා 04 කින් යුක්ත ප්‍රතිමා සංකීර්ණයක ඇති එකම හිටි පිළිමය වන්නේ මෙම ප්‍රතිමාවයි. මෙම ප්‍රතිමාව පිහිටි පර්වතයේ උසින් වැඩිම ස්ථානයේ නිර්මිත අතර මෙම ප්‍රතිමාවට දකුණු පසින් පරිනිර්වාණ පිළිමය ද, වම් පසින් සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහිත ලෙන ද නිර්මාණය කර ඇත. ගල් විහාරය පිළිබඳ ඇති සාහිත්‍යයම සාධකයන් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වැදගත් කාරණා කිහිපයක් මෙම හිටි ප්‍රතිමාව ගැන තහවුරු කරගත හැකිය. මහා වංශය, නිකාය සංග්‍රහය, රාජරත්නාකරය සහ පූජාවලියේ සඳහන් වන පරිදි මහා පරාක්‍රමබාහු රජු විසින් උත්තරාරාමය නිර්මාණය කරන ලද බවයි.

**සාකච්ඡාව**

**මුද්‍රාව පිළිබඳ අර්ථකථන**

මෙම බුද්ධ ප්‍රතිමාවෙන් ප්‍රකටවන මුද්‍රාව පිළිබඳව විවිධ විද්වතුන් අතර මතවාදයන් පවතී. එසේම මුද්‍රාව සඳහා විවිධ වූ නාමයන් ප්‍රකාශ කරන අතර එමඟින් ප්‍රකට කරවන අර්ථය පිළිබඳව ද අදහස් ගණනාවක්ම හඳුනාගත හැකිය. මෙම මුද්‍රාවේ මූලික හැඩය නම් දෙඅත් පපුව ආසන්නයේ දී එකිනෙක බැඳගෙන සිටින ස්වරූපයකින් දැක්වීමයි (ඡායාරූපය 02).

***පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව***

මෙම ඉරියව්ව, පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස මහාචාර්ය සෙනරත් පරණවිතානයන් සඳහන් කරයි (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1972).

> බුදුරජාණන් වහන්සේ පරදුක්ඛ දුක්ඛිතයාණන් (අනුන්ගේ දුක් ගැන දුක් වූ උතුමාණන්) වශයෙන් නිරූපණය කිරීම ශිල්පියාගේ අදහස වූ බවත් ඒ අදහස උසස් ලෙස සඵල වී තිබෙන බවත් පැහැදිලිය (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1972, පි. 573).

ඒ සඳහා ධම්ම පදයේ එන විස්තරයක් ගෙනහැර දක්වයි. එහි සඳහන් වන පරිදි බුදුන් වහන්සේ ප්‍රඥාව නමැති ප්‍රසාදයට නැග පහළ දුක්විඳින අය දෙස කරුණාවෙන් බලන බව ය. එම ධම්ම පදය අර්ථකථනය කරමින් සෙනරත් පරණවිතාන මෙය පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස අර්ථකථනය කරයි. බුදුරාජණන් වහන්සේ විසින් දේශනා ලද ධර්මයන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසුව පැවත්වූ පළමු ධර්ම සංගායනවේ දී පිටක තුනකට බෙදන ලදී. මෙහි සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථ පහෙන් ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් ලෙස ධම්ම පදය දැක්විය හැකිය. ධම්මපදයේ දෙවන වග්ගය වන අප්පමාද වග්ගයෙහි 8 වෙනි ගාථාව (ධම්මපදයේ 28 වෙනි ගාථාව) උපයෝගී කරගෙන ඉහත මතය සෙනරත් පරණවිතානයන් විසින් ගෙනහැර දක්වයි.

28. පමාදං අප්පමාදෙන
යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාද මාරුය්හ
අසොකො සොකිනිං පජං
පබ්බතටෙඨාව භුම්මටෙඨ
ධීරො බාලෙ අවෙකඛති.

යම් කලෙක නුවණැත්තා අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරු කරයි ද, ශෝක රහිතවූ වීර්යවත්වූ හෙතෙම ප්‍රඥා නමැති ප්‍රාසාදයට නැගී ශෝක සහිතවූ අඥාන වූ සත්ත්ව සමූහයා දෙස බලයි. (කවරෙකු මෙන්ද?) පර්වතයකට නැගි මිනිසෙක් පහත් බිම සිටි මිනිසුන් දෙස බලන්නාක් මෙනි. (ජේතවනාරාමය - මහ කස්සප තෙරුන් ආරබයා කළ දේශනය) (බුද්ධදත්ත, 1962, පි. 10)



**ඡායාරූපය 02ඃ පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව / අනිමිස ලෝචන මුද්‍රාව දැක්වෙන දළ සටහන**

***අනිමිසලෝචන මුද්‍රාව***

පී. එල්. ප්‍රේමතිලකගේ මතය වූයේ මෙමගින් අනිමිස ලෝචන පූජාව නිරූපිත බවයි. එබැවින් මෙම මුද්‍රාව අනිමිසලෝචන මුද්‍රාව ලෙස හඳුන්වනු ලබයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව දෙවන සතිය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඊසාන දෙසින් වැඩ සිටිමින් ඇසිපිය නොගසමින් බෝධියට කළගුණ සැලකීම මින් නිරූපිත බව ඔහුගේ මතයයි. මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහිත විහාර කිහිපයක නිරූපිත සත් සතියේ දෙවන සතිය නිරූපණය කිරීම සඳහා භාවිත වූ මුද්‍රාව මෙම ඉරියව්වෙන් යුක්ත බැවින් මෙම ප්‍රතිමාව ද එම අවස්ථාව නිරූපණය කරන බව ඔහුගේ අදහස විය (Prematilleke, 1966).

> But the examination of the Ceylon temple paintings of the Kandyan times reveals that, among the scenes depicting the Seven Weeks after Enlightenment of the Buddha, the Second Week, *Animisalocana-puja* (gazing with unblinking eye) is shown with the Buddha standing with his hands crossed before the Bodhi Tree (Prematilleke, 1966, P. 65).

***අවධාන මුද්‍රාව***

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මතය වූයේ මෙම මුද්‍රාව අවධාන මුද්‍රාව ලෙස ය. ගල්විහාරයේ ප්‍රතිමාවේ මුහුණෙන් අවධානය ප්‍රකාශ කරවන මුහුණුවරක් නිරූපණය වන බැවින් එම හේතුවෙන් මෙය අවධාන මුද්‍රාව ලෙස අර්ථ කථනය කරයි.

> පිළිමයක නිතරම වාගේ සංයුක්ත මුද්‍රා දක්නට ලැබේ. ප්‍රතිග්‍රහණ, ධ්‍යාන හා ධර්මචක්‍ර සහ අවධාන මුද්‍රාවලදී අත් දෙකම එකම මුද්‍රාවකින් යුක්තය. පොළොන්නරුව ගල්විහාරයේ හිටි බුදුපිළිමය ඇතුළු බුද්ධ, මිනිස්, දේව, ප්‍රතිමා කීපයක පපුව හරහා අත් බැදගෙන සිටින අතර ඒ සියළු පිළිමවල පොදු ලක්ෂණය අවධානයයි. එනිසා මෙය අවධාන මුද්‍රා නමින් හැඳින්විය හැකිය (වික්‍රමගමගේ, 2006, පි. 46).

එසේම තිවංක පිළිමගෙයි ආසංකවතී ජාතකයේ ඇති සිතුවමක්, යටාල වෙහෙරෙන් හමු වූ ප්‍රතිමාව සහ දඹුල්ලේ ඇති ප්‍රතිමාව සහ සිතුවමෙහි ද, ඉහත කී අවධානය මුහුණෙන් ප්‍රකටවන ස්වරූපයෙන් යුක්ත බව ය (වික්‍රමගමගේ, 2011). එසේම අවධාන මුද්‍රාවෙන් ප්‍රකාශිත අර්ථය වූයේ බුදුරාජණන් වහන්සේ දුක් විඳින සත්ත්වයන් ගැන අවධානයෙන් පසුවන බව වික්‍රමගමගේ මහතාගේ මතය විය (වික්‍රමගමගේ, 2011). ඒ අනුව අවධාන මුද්‍රාව ලෙස ගල්විහාරයේ හිටි පිළිමයේ මුද්‍රාව හඳුනාගත හැකිය. මේ පිළිමයෙන් ප්‍රකාශ වනුයේ බුදුන් වහන්සේ දුක් විඳින සත්වයන් ගැන අවධානයෙන් සිටින බවයි (වික්‍රමගමගේ, 2011).

*ස්වස්තික මුද්‍රාව*

ගුණපාල සේනාධීර සහ මහාචාර්ය විමල විජයසූරිය ප්‍රකාශ කරනු ලබන්නේ මෙය ස්වස්තික මුද්‍රාව බව ය (ලගමුව, 2021). මහාචාර්ය විමල විජයසූරිය මෙම මුද්‍රාව ස්වස්තික මුද්‍රාව බව ප්‍රකාශ කිරීමට නිදසුන් රාශියක් ගෙනහැර දක්වා ඇත.

> 01. ගුණපාල සේනාධීරයන් ආචාර්ය උපාධියේ දී අෂ්ට මංගලාදියෙහි ස්වස්තිකය පිළිබඳ අර්ථකථනයන් දක්වා ඇති අතර එම අර්ථකථනය මෝනියර් විලියම්ස්ගේ සංස්කෘතික මහා ශබ්ද කෝෂයේ උපුටා ගත්

බව සඳහන් කර ඇත. එහි ස්වස්තිකදාන යන වචනයේ අර්ථය ලෙස Crossing the Hands, Balar. ලෙස සඳහන් කර ඇත (විජයසූරිය, 1996, පි. 32).

02. බාලරාමායණයේ මෙය ස්වහස්තස්වස්තිකස්තනී යන නාමයෙන් හඳුන්වන බවත්, එහි අර්ථය ලෙස පියොවුරු මත දෙ අත බැඳ ගත්තී ලෙස දක්වා ඇත (විජයසූරිය, 1996, පි. 33).

03. සර්වදර්ශන සංග්‍රහයෙහි ස්වස්තිකාසන වචනය දක්වා ඇති අතර එහි අර්ථය ලෙස පපුව හරහා බැඳි යන අදහස දක්වා ඇත (විජයසූරිය, 1996, පි. 33).

04. ආනන්ද කේ. කුමාරස්වාමිගේ Bronzes from Ceylon කෘතියෙහි හෙන්රි පාකර් විසින් ස්වස්තික මුද්‍රාව පිළිබඳ දක්වා ඇති අදහස ද භාවිත කර ඇත.

> The Indian meaning of the Swastika, the cross with bent arms is 'Svasti-' It is well that is may it be well (විජයසූරිය, 1996, පි. 33).

05. බෙන්ජමින් රෝලන්ඩ් විසින් ඉන්දු නිම්නයේ සහ මෙසොපොතේමියානු මූර්ති සහ ඵලකවල ද පපුව හරහා අත් බැඳි ස්වරූපයෙන් යුක්තව නිරූපිත කර ඇති බවත්, සශ්‍රීකත්වය එයින් නිරූපණය කරන ලද බව ය (විජයසූරිය, 1996, පි. 33-34).

06. නන්දිකේශ්වරගේ අභිනය දර්පණයෙහි සහ භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ස්වස්තික හස්ත නම් අභිනයක් පිළිබඳ දක්වා ඇත. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ පහත පරිදි දක්වා ඇත.

> දෙ අත්හි මැණික් කටු දෙකින් විදහා ගත් පතාක (දිග කොඩි) දෙකකින් (මෙන්) එකතු වූයේ ස්වස්තික නම් වෙයි. මකරාකාරව අත් හරහට එකතු කිරීමෙහි යොදනු ලැබේ යනු එහි අදහසයි (විජයසූරිය, 1996, පි. 34-35).

නන්දිකේශ්වරගේ අභිනය දර්පණයෙහි මණ්ඩල සොළොස අතුරින් ස්වස්තික මණ්ඩල පිළිබඳව පහත පරිදි දක්වා ඇත.

> දක්ෂිණෝත්තරතඃ කුර්යාත් පාදෙ පාදංකරෙ කරම්
> ව්‍යාත්‍යාසෙන තදා ප්‍රොක්තං ස්වස්තිකං නාම මණ්ඩලම්

මෙහි ද ස්වස්තික මණ්ඩලය මවා පෑමේ දී නළුවා අත් සහ පාද එකිනෙක හරස් කොට (ව්‍යාත්‍යාස්‍ය) තබා ගත යුතු බව කියවේ (විජයසූරිය, 1996, පි. 35).

07. ස්වස්තික මණ්ඩලය අර්ථ කථනය කරන ආචාර්ය මනමෝහන් ඝොෂ් අත්පා එකිනෙක හරහා බැඳ ගෙන සිටින අභිනය ස්වස්තික නම් වන බව ය.

> SWASTIKA, The right foot should be put across the left foot and the right hand should be put across the left hand, thus will be Swastik Posture (විජයසූරිය, 1996, පි. 35).

08. කුමුදාකරමතිපාදයන් විසින් රචිත සාධනමාලා කෘතියෙහි සහ බෙනෝය්තෝෂ් භට්ටාචාර්යන් විසින් රචිත ත්‍රිසමය රාජසාධන කෘතියෙහි මුද්‍රාවන් පිළිබඳ සඳහන් කරන අතර එහි ද ස්වස්තික මුද්‍රාව පිළිබඳ දක්වා ඇත (විජයසූරිය, 1996, පි. 35-36).

09. පණ්ඩිත රත්නකරගුප්ත පාදයන් ගේ පහත දැක්වෙන පාඨයෙන් ස්වස්තික මුද්‍රාව බිහිවීමේ අරමුණු පැහැදිලි වන බව දක්වා ඇත (විජයසූරිය, 1996, පි. 35-36).

> අනෙන ස්තොත්‍ර රාඥා වෛ - තොෂිතාස්තෙ තථාගතාඃ
> දදන්ති විපුලාං සිද්ධිං - කල්පස්ථාං කල්ප චෝදිතාම්
> සර්වාශා පරිපූර්ණං ච - දදන්ති මනසෙප්තිසාම්
> ඥානමායුර්බලං වේගං - දදන්ති පරමං ශුභම් (විජයසූරිය, 1996, පි. 37).

මෙම සියලු සාධකයන් අර්ථකථනය කර මෙම මුද්‍රාව ස්වස්තික මුද්‍රාව බව ඔහු ප්‍රකාශ කරනු ලබයි.

***මහාප්‍රඥාපාරමිතා මුද්‍රාව***

අර්නස්ට් ඩේල් සෝන්ඩර්ස් මුද්‍රා නැමති කෘතියෙහි සාධනා පිළිවෙත් පහකින් එකක් ලෙස මහාප්‍රඥාපාරමිතාව දක්වා ඇති බව මහාචාර්ය විමල විජයසූරිය පෙන්වා දෙයි. සෝන්ඩර්ස් විසින් ගල් විහාරයේ හිටි ප්‍රතිමාවේ දෑත් තබා ඇති ස්වරූපය අනුව එයින් මහාප්‍රඥාපාරමිතා මුද්‍රාව නියෝජනය කරන බව සඳහන් කරයි.

> The priest seats himself in Padmasana. He makes the Mudra of Purity holding his two hands in front of his heart, empty of passions he joins his plams (විජයසූරිය, 1996, පි. 37).

එසේම විවිධ පර්යේෂකයින් විසින් මෙම බුද්ධ ප්‍රතිමාව පිළිබඳව එයින් ප්‍රකටවන අර්ථය පිළිබඳව මතවාද ඉදිරිපත් කර ඇත. එම මතවාද මෙම පිළිමය බුද්ධ ප්‍රතිමාවක් හෝ අරහත් රූපයක් විය යුතු බවට තර්කනය කර ඇත.

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශයේ සම්මානිත මහාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලද අතර ඔහු විසින් 1993 දී ප්‍රකාශයට පත්කරන ලද පොළොන්නරුවේ ගල් විහාරය නැමැති කෘතියෙන් හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳ ඔහුගේ අදහස් ප්‍රකාශයට පත්කර තිබේ. මෙම ප්‍රතිමාව ආනන්ද හිමියන්ගේ යැයි ප්‍රකාශිත මතය වික්‍රමගමගේ මහතා ප්‍රතික්ෂේප කරන අතර, සෙනරත් පරණවිතානගේ මතය වූ බුදුන්ගේ ප්‍රතිමාවක් යන මතය ඔහු තහවුරු කරනු ලබයි. ඒ සඳහා ඔහු අදහස් කිහිපයක් ඉදිරිපත් කරනු ලබයි. පළමුවැන්න නම් 12 වෙනි සියවසේ රචනා වූ ශාරිපුත්‍ර ග්‍රන්ථයේ බුදුපිළිම හිඳි, හිටි සහ සැතපෙන යන තුන් ඉරියව්වෙන්ම යුක්ත වන බැවින් ගල් විහාරයේ හිටි ප්‍රතිමාවෙන් ද, බුදුරාජණන් වහන්සේ නිරූපණය කළ බව ය. දෙවැන්න නම් පද්මාසනය භාවිත කරනු ලබන්නේ බුද්ධ ප්‍රතිමා සහ දේව ප්‍රතිමාවලට පමණක් බවත් කිසිඳු ස්ථානයක පරිවාර භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පද්මාසනය භාවිත නොකළ බව ය. තෙවැන්න නම් ප්‍රතිමාවේ දක්නට ලැබෙන රූපභේදයන්ගෙන් ද මෙය බුද්ධ ප්‍රතිමාවක් බව ඔහු තහවුරු කරනු ලැබේ. මහාපුරුෂ ලක්ෂණ සහ සිරස්පතක් ප්‍රතිමාවට තිබූ බවට වූ ලක්ෂණ හේතුවෙන් බුද්ධ ප්‍රතිමාවක් බව ප්‍රකාශ කරනු ලැබේ. එසේම මෙම හිටි බුද්ධ ප්‍රතිමාව පරාක්‍රමබාහුගේ නිර්මාණයක් නොවෙන බවට ඉදිරිපත් කරන මතවාදයන්ට ඔහුගේ මතය ලෙස දක්වනු ලබන්නේ මෙම ප්‍රතිමාවේ චීවරයේ ද, ද්විත්ව රැලි නිරූපිත බැවින් මෙම ප්‍රතිමාව ද පොළොන්නරු යුගයට අයත් බව ය (වික්‍රමගමගේ, 2011).

මුද්‍රාව පිළිබඳව පෙර විද්වතුන් අදහස් කරන ලද මතවාද ත්‍රිත්වයක් පිළිබඳව වික්‍රමගමගේ මහතා අදහස් ප්‍රකාශ කරනු ලබන අතර ඔහු ද මෙම ප්‍රතිමාවේ මුද්‍රාව පිළිබඳ ස්වකීය අදහස ද ප්‍රකාශයට පත් කර ඇත. සෙනරත් පරණවිතානයන් මෙම මුද්‍රාව හඳුන්වා දෙනු ලැබුවේ පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස ය. පරණවිතාණයන් මෙම මතය ප්‍රකාශ කිරීම සඳහා ධම්ම පදයේ එන ගථාවක් උපයෝගීකර ගත් අතර එයට අනුව මෙම ප්‍රතිමාව නිරූපණය කළ බව ය. නමුත් මෙලෙස ප්‍රතිමාව නිර්මාණය කිරීමට හේතුව ලෙස වික්‍රමගමගේ මහතාගේ අදහස වූයේ පර්වතයේ උස ප්‍රමාණය එයට හේතු වූ බවයි. එම නිසා ඔහු මෙම ප්‍රතිමාවේ මුද්‍රාව පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස හැඳින්වීම වැරදි බව ඔහුගේ අදහස විය (වික්‍රමගමගේ, 2011).

මහාචාර්ය විමල විජයසූරිය සහ ගුණපාල සේනාධීරයන්ගේ මතය වූයේ ස්වස්තික මුද්‍රාව බව ය (වික්‍රමගමගේ, 2011). වික්‍රමගමගේ මහතා ස්වස්තික මුද්‍රාව නිරූපණය කිරීමේ ක්‍රමවේදය වූයේ අත්දෙක මැණික්කටුව හන්දිය ළඟින් හරහට තබා දෙඅල්ල ඉදිරියට හරවා තබා ගැනීමෙන් නිරූපණය කළ බව ය. එම නිසා එම මුද්‍රාව මෙයින් නිරූපණය නොවූ බව ඔහු අදහස් කරන ලදී. එසේම මහාචාර්ය අනුර මනතුංග මහතාගේ මතය වූයේ මෙයින් වජ්‍රහූංකාර මුද්‍රාව බව ය (වික්‍රමගමගේ, 2011). වජ්‍රහූංකාර මුද්‍රාව මහායාන මුද්‍රාවක් බවත්, දෑත් මැණික්කටුව හන්දිය ළඟින් හරහට තබා එක් අතකින් වජ්‍රයත්, අනිකෙන් ඝණ්ටාවත් දරා සිටින බව ඔහු දක්වන අතර එම ලක්ෂණ මෙම ප්‍රතිමාවේ නොමැති බව ප්‍රකාශ කර ඇත. එසේම වජ්‍රහූංකාර මුද්‍රාව බුද්ධ ප්‍රතිමා සඳහා විශේෂ වූ මුද්‍රාවක් නොවන බව ද ඔහු දක්වා ඇත (වික්‍රමගමගේ, 2011).



**ඡායාරූපය 03ඃ පොළොන්නරුව ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව, ක්‍රි. ව. 12 වන සියවස, කළුගල්, උස අඩි 22 අඟල් 6, පොළොන්නරුව ගල් විහාරය**

වික්‍රමගමගේ මහතාගේ මතය වූයේ මෙම ප්‍රතිමාවෙන් නිරූපණය වූ මුද්‍රාව වූයේ අවධාන මුද්‍රාව බව ය. ඒ සඳහා ඔහු ගෙන ආ හේතු සාධකයන් වූයේ තිවංක පිළිමගෙයි ආසංකවතී ජාතකයේ අවස්ථා නිරූපණයේ දී මෙම ස්වරූපයෙන් ආසංකවතී සහ තාපසයා දෑත් බැඳගෙන සිටින බව ය. එසේම යටාල වෙහෙරින් හමු වූ ප්‍රතිමාව ද, දඹුල්ල මහාරාජ ලෙනෙහි ඇති බුද්ධ ප්‍රතිමාව සහ සිතුවමෙහි ද, මෙම ඉරියව්ව දැකගත හැකි බව ය. ඒ සෑම ස්ථානයකම මුහුණුවලින් අවධානය ප්‍රකාශවන බවත් එම නිසා මෙම මුද්‍රාව අවධාන මුද්‍රාව ලෙස ප්‍රකාශ කර ඇත (වික්‍රමගමගේ, 2011).

එසේම ආනන්ද හිමියන්ගේ යැයි ප්‍රකාශිත මතය බැහැර කරන වික්‍රමගමගේ මහතා පිළිමයේ තොල්වලින් නිරූපිත වන්නේ මන්දස්මිතය බවත්, ශෝකී මුහුණවරක් මෙහි ප්‍රකට නොවන බවත්, වෙනම ප්‍රතිමා ගෘහයක් ලෙස මෙම ප්‍රතිමාවත් ඇතුලත් ව නිර්මාණය කර තිබෙන බැවින් මෙය බුද්ධ ප්‍රතිමාවක් බව ඔහුගේ මතය වී ඇත (වික්‍රමගමගේ, 2011).

මහාචාර්ය ආරිය ලගමුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලද අතර ඔහු විසින් 1999 දී ප්‍රකාශයට පත්කරන ලද මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව නැමැති කෘතියෙන් ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳ ඔහුගේ අදහස් ප්‍රකාශයට පත්කර තිබේ. ආරිය ලගමුව මහතා ආනන්ද හිමියන්ගේ යැයි ප්‍රකාශිත මතය බැහැ කරන අතර ඔහු ඒ සඳහා හේතු සාධකයන් කිහිපයක් ගෙන හැර දක්වයි. මෙම ප්‍රතිමාවේ මුහුණෙන් ප්‍රකාශ වන්නේ දුක්මුසු විලාශයක් නොවන බවත්, එයින් ප්‍රකාශවන්නේ සියලු සම්බාධකවලින් දුරුව සියල්ල ජයගත් සැහැල්ලු කරුණා මෛත්‍රිය ඔප් නැගෙන උපශාන්ත ස්වරූපයක් බව ප්‍රකාශ කරයි. එසේම මෙවැනි ඉරියව්වක් සහිත ප්‍රතිමා රිටිගල, යටාල වෙහෙර, දඹුල්ල සහ හිඳගල යන විහාර ආශ්‍රිතව දැකගත හැකි බවත් නිසැකවම එම නිසා මෙම ප්‍රතිමාව ද, බුද්ධ ප්‍රතිමාවක් බව ඔහු අදහස් කරයි (ලගමුව, 2021). එසේම බුද්ධ ප්‍රතිමා නිරූපණයේ දී හිඳි, හිටි සහ සැතපෙන ප්‍රතිමා යන ත්‍රිත්වයෙන්ම අන්තර්ගත විය යුතු බවත්, එම නිසා ගල් විහාරයේ හිඳි සහ සැතපෙන ප්‍රතිමා සමග මෙම හිටි හෝ සක්මන් ප්‍රතිමාවක් ද නිරූපිත වියයුතු බව ඔහුගේ මතයයි. එසේම සැතපෙන හා හිටි ප්‍රතිමා සඳහා වෙන වෙනම ප්‍රතිමාඝර ඉදි වූ බවට සාධක ඇති බැවින් මෙය වෙනම නිර්මාණය කළ හිටි බුද්ධ ප්‍රතිමාවක් බව දක්වයි. ශ්‍රාවක භික්ෂූන් වහන්සේ නමකගේ ප්‍රතිමාවක් සඳහා නෙළුම් මල් පිඨියක් දේශීය කලාකරුවා කිසිඳු අවස්ථාවක භාවිත නොකළ බවත්, බුද්ධ ප්‍රතිමා සඳහා පමණක් නෙළුම් මල් පිඨිය භාවිත කළ බවත් එබැවින් මෙම බුද්ධ ප්‍රතිමාවක් ලෙස පිළිගැනීම නිවැරදි බව අදහස් කර ඇත. එසේම බුද්ධ ප්‍රතිමාවක් ලෙස හඳුනාගැනීමට ඇති දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් ද අන්තර්ගත වන බව දක්වන අතර, උෂ්ණීෂය, අක්බඹරු කේෂ, ලම්බකර්ණ, ත්‍රිවිලිය, අත්පාවල පරිපූර්ණ භාවය වැනි ලක්ෂණ ගෙනහැර දක්වා ඇත (ලගමුව, 2021).

එසේම පරදුක්ඛ දුක්ඛිත බව ප්‍රතික්ෂේප කරන ඔහු බුදුන් අටලෝ දහමෙන් කම්පා නොවන බැවින් එම මතය නොගැලපෙන බව ය. අනිමිසලෝචන පූජාව නිරූපිත යැයි ප්‍රේමතිලක සහ රෝලන්ඩ් සිල්වා ගේ මතය ද ප්‍රතික්ෂේප කරන අතර ඒ සඳහා ඔවුන් ප්‍රමාණවත් සාධක ඉදිරිපත් නොකරන බව ද ඔහුගේ අදහස වන්නේ ය. එසේම ඔහුගේ අදහස වන්නේ බුදුන් වහන්සේ සිටගෙන අනිමිස ලෝචන පූජාව පැවැත් වූ බව සඳහන් නොවන බව ය (ලගමුව, 2021).

ලගමුව තවදුරටත් පෙන්වා දෙන්නේ මෙම ප්‍රතිමාව ද්විභංග ප්‍රතිමාවක් බවත්, එනම් දණහිස හා ඉගටිය යන දෙතැනින් ශරීරයේ රිද්මය බිඳී ඇති බව ය. එය සක්මන් ඉරියව්වට සුදුසු ඉරියව්වක් බව සඳහන් කරන ඔහු මුහුණේ ස්වරූපය දෑත් පිහිටි ආකාරය සහ සක්මන් ඉරියව්වේ ස්වරූපය ප්‍රතිමාවෙන් ප්‍රකටවන බව ය. ලගමුවගේ ප්‍රධාන මතවාදයක් ලෙස ප්‍රකාශ කරන්නේ මෙම ප්‍රතිමාවෙන් සත්සතියේ තෙවන සතිය ප්‍රකටවන බව ය. ගල්විහාරයේ වම්පස ඇති හිඳි ප්‍රතිමාවෙන් පළමු සතියේ බුදුන් සමාධි සුවයෙන් වැඩ හිඳි අවස්ථාවත්, ලෙනෙහි පිහිටි හිඳි ප්‍රතිමාවෙන් දෙවන සතියේ අනිමිසලෝචන පූජාවත් නිරූපන කරන අතර හිටි ප්‍රතිමාවෙන් තෙවන සතියේ රුවන් සක්මන නිරූපණය කරන බව ය. එසේම මෙය සක්මන් ඉරියව්ව බව තහවුරු කිරීම සඳහා ගල් විහාර ආසන්නයේ ඇති තිවංක පිළිමගෙයි සංකස්සපුර හිනිමන් දර්ශනය ගෙනහැර දක්වයි. එසේම

මාතර ගොඩපිටිය විහාරයේ ඇති අඟල් 03 ක් පමණ උස සක්මන් ඉරියව්වෙන් යුක්ත ලෝහ ප්‍රතිමාව ද, දක්වන නමුත් එහි මුද්‍රාව සහ අරමුණ සමාන නොවන බව ද දක්වයි (ලගමුව, 2021).
ලගමුවේ ගේ දෙවන මතය වන්නේ ධම්මපදයේ එන ගාථාවක සඳහන් කරුණක් පදනම් කරගෙන ඉදිරිපත් කරයි. සියලු කෙලෙස් දුරුකළ බුදුන් වහන්සේ ගිරි මුදුනේ සිට දුක් විඳින සතුන් කෙරෙහි කරුණා බැල්ම හෙළන අවස්ථාව නිරූපිත බව ය. පත්ම ආසනය පර්වත කූටය ලෙසත්, එය මිනිසෙකුගේ හිස මට්ටමට වඩා උස්වන බැවින් ගිරි ශිඛරයක් ලෙස නිර්මාණය කළා විය යුතු බව ඔහු සඳහන් කරයි. ප්‍රතිමාවේ ඉදිරියේ සිට ප්‍රතිමාවේ මුහුණ බලන්නෙකුට පෙනෙන්නේ බුදුන් වහන්සේ කාරුණික බැල්මක් යොමු කරන ස්වරූපයක් බව ඔහුගේ අදහස වන්නේ ය (ලගමුව, 2021).

ලගමුව මහතාගේ දෙවන සතිය නිරූපනයේ දී එනම් අනිමිසලෝචන පූජාවේ දී බුදුන් සිටගෙන නොසිටි බව ප්‍රකාශ කර ඇත. නමුත් සත්සතිය පිළිබඳ සඳහන් ලිඛිත මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සිටගෙන මෙන්ම හිඳගෙන ද, එම අවස්ථාව නිරූපිත ඉරියව්වක් නොදක්වමින් ද සත්සතිය පිළිබඳව වාර්තාගත කර ඇත. පූජාවලියේ දෙවන සතිය පිළිබඳ සඳහන් කිරීමේ දී බුදුන් අනිමිසලෝචන පූජාවේ සත් දවසක් ධ්‍යාන සුවයෙන් වැඩ සිටි බව දක්වා ඇත. ධ්‍යාන සුවය නිරූපිත සෑම අවස්ථාවකම එය දක්වනු ලැබුවේ හිඳි ඉරියව්වනි. ඒ අනුව ලගමුව සඳහන් කරන කාරණය තහවුරු කිරීමට පූජාවලියේ එන එම විස්තරය පැහැදිලිව හේතු සාධක වූවා විය හැකිය.

> ...... අනිමිස ලොචන නම් පූජාවක් කොට සද් දවසක් ධ්‍යාන සුවයෙන් වැඩ සිටිසේක ...... (ඤාණවිමල, 1951, පි.192).

ලගමුවගේ මතය තහවුරු කරන දෙවන සාධකය වන්නේ දීපවංසයේ සත්සතිය පිළිබඳ එන පළමු මූලාශ්‍රයයි. එම මූලාශ්‍රයේ සත්සතිය උතුම් ආසනයෙහි ම සත් දිනක් වැඩ සිටි බව දක්වයි.

> 14. සියලු ධර්මයන්ගේ අවබෝධය ලැබ, උදන වාක්‍ය ප්‍රකාශ කොට, බුදුරජාණන් වහන්සේ එම උතුම් ආසනයෙහි ම සත් දිනක් වැඩ සිටි සේක (පොන්සේකා, 2019, පි. 205).

එම සඳහන් දින හත තුළ අනිමිසලෝචන පූජාවත් නිරූපිත වූවා නම්, මෙහි එම පූජාව නිරූපණය වී ඇත්තේ ආසනයක් මත වීමත් බොහෝ විට එය හිඳි ඉරියව්වක් විය යුතුය.

එසේම බුදුන් සත්සතිය ගත කිරිමේ දී හිටි ඉරියව්වෙන් යුතුව ගත කළ බව සාහිත්‍ය ලේඛන කිහිපයකම දක්වා ඇත. මහාවස්තුව, නිදාන කථාව සහ දළදා සිරිතෙහි මෙලෙස බුදුන් වහන්සේ සිටි ඉරියව්වෙන් අනිමිසලෝචන පූජාවේ යෙදුනු බව සඳහන් කරයි. මහා වස්තුවේ දෙවන සතිය සඳහන් කර ඇත්තේ "දින හතක් ගතවීමෙන් සිහිසුනෙන් නැඟී සිට ලොව්තුරා බුදුන් වහන්සේ සිටගෙන නාග රාජයකු මෙන් ඇසිපිය නොහෙළා බෝධි වෘක්ෂය දෙස බලා සිටි බව සඳහන් වේ" යනුවෙන් දක්වා ඇත (Jones, 1956).

නිදාන කථාවේ ද, දෙවැනි සතිය දක්වා ඇත්තේ "මෙසේ ශාස්තෘන් වහන්සේ ප්‍රාතිහාර්යෙන් දෙවියන්ගේ සැක දුරුකරමින් සිංහාසනයට මඳක් ඊසාන දෙසින් සිටගෙන මෙලෙස මෙනෙහි කරන ලද සේක; "....... යනුවෙන් සඳහන් කර ඇත (Davids, 2020).

දළදා සිරිතෙහි දෙවන සතියේ දී බුදුරාජණන් වහන්සේ තම ආසනයෙන් නැගිට ඊසාන දෙස සිට අනිමිස ලෝචනයෙන් වැඩ සිටි බව සඳහන් කර ඇත.

> විදුරස්නෙන් නැඟී ශ්‍රී මහා බොධීන්වහන්සේට ඉසාන දිග වැඩසිට ජය මහා බෝධීන්වහන්සේටද අපරාජිතාසන යටද අනිමිෂ ලොචනයෙන් පුද වදරා ...... (රාජශෙඛර, 2015, පි. 11)

නමුත් සත්සතිය සම්බන්ධ බිතු සිතුවම් පිළිබඳ අධ්‍යයනය කිරිමේ දී අනිමිසලෝචන පූජාව සම්බන්ධ සෑම බිතු සිතුවමක් සඳහාම යොදාගෙන ඇත්තේ හිටි ඉරියව්ව පමණකි. එවැනි සිතුවම් දඹුල්ල, හිඳගල, දෙගල්දොරුව, මැදවල සහ තවත් විහාර රාශියක් ආශ්‍රිතව දැකගත හැකිය. නමුත් වර්ෂ 1990 සිට 1998 අතර කාලයේ සිතුවම් නිර්මාණය කරන ලද බෙල්ලන්විල රජමහා විහාරයේ බිතු සිතුවම් හි අනිමිසලෝචන පූජාව නිරූපණය කර ඇත්තේ බුදුරාජණන් වහන්සේ හිඳි ඉරියව්වෙන් යුතුව ය. එසේම එහි මුද්‍රාව වන්නේ පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව වීම ද සුවිශේෂී ය. මේ නිසා ලගමුවගේ මෙම මතය ගත්කළ නිවැරදි නොවන බව තහවුරු වන්නේ ය. සාහිත්‍ය මූලාශ්‍රවල මෙන්ම බිතු සිතුවම්වල ද, හිඳි සහ හිටි යන ඉරියව් ද්විත්වයෙන්ම නිරූපිත වන බව පැහැදිලි ය.

ලගමුව විසින් මෙම ප්‍රතිමාවේ දණහිස හා ඉඟටිය යන ස්ථානයන්ගෙන් ශාරීරයේ රිද්මය බිඳීම නිසා ඉරියව්ව ද්විභංග බවත්, මුහුණේ ප්‍රකාශිත හැඟීම් සහ දෑත් පිහිටා ඇති ආකාරයත් සක්මන් ඉරියව්වට උචිත බවත් ප්‍රකාශ කර ඇත. ඔහුගේ මතය ලෙස දක්වනු ලබන්නේ මෙයින් තෙවන සතිය නිරූපණය කරන බව ය. පළමු හිඳි ප්‍රතිමාවෙන් පළමු සතිය ද, ලෙනෙහි වූ හිඳි ප්‍රතිමාවෙන් දෙවන සතිය ද, හිටි ප්‍රතිමාවෙන් තෙවන සතිය වූ රුවන් සක්මන ද නිරූපණය කරන බව ය. නමුත් තෙවන සතියෙන් පසුව වූ සති හතර පිළිබඳ කිසිඳු සඳහනක් නොමැත. එම නිසා එම මතය නිවැරදි නොවන බව පැහැදිලි ය.

ලගමුවේ ගේ දෙවන මතය වූයේ ධම්මපදයේ අප්පමාද වග්ගයේ ගාථාවක සඳහන් කරුණක් පදනම් කරගෙන ඉදිරිපත් කර ඇති අතර එයින් සියලු කෙලෙස් දුරුකළ බුදුන් වහන්සේ ගිරි මුදුනේ සිට දුක් විඳින සතුන් කෙරෙහි කරුණා බැල්ම හෙලන බව සඳහන් කර ඇත. එම අවස්ථාව මෙම ප්‍රතිමාවෙන් නිරූපිත වූ බව ඔහුගේ අදහස වන්නේ ය. මෙම මතය යම්තාක් දුරකට පිළිගත හැකි මතයකි. එනම් ප්‍රතිමාවේ ඉදිරියේ සිට ප්‍රතිමාවේ මුහුණ බලන්නෙකුට පෙනෙන්නේ බුදුන් වහන්සේ කාරුණික බැල්මක් යොමු කරන ස්වරූපයක් බව ඔහුගේ අදහස වන අතර මෙයින් බුදුන් නිරූපණය වූවා නම් ඔහුගේ මතය පිළිගත හැකිය.

ආචාර්ය නන්දදේව විජේසේකර ලංකාවේ බිහි වූ ප්‍රථම සිංහල මානව විද්‍යාඥයා වන අතර මානව හා පුරාවිද්‍යාව පිළිබඳ උපාධියක් ලත් ප්‍රථම ශ්‍රී ලාංකිකයා ලෙස සලකනු ලබන්නේ ඔහු ය. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය ආරම්භ කිරීමේ පුරෝගාමී වූ ඔහු ලංකා විශ්වවිද්‍යාලයේ දේශකයෙක් ලෙස ද කෙටි කාලයක් සේවය කරන ලද අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පිරිනමන සාහිත්‍යසූරී සම්මාන උපාධිය ද ඔහුට පිරිනමන ලදී. ඔහු විසින් 1970 දී රචිත පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය (Early Sinhalese Sculpture) නම් කෘතියෙහි ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳ අදහස් ප්‍රකාශයට පත්කර ඇත.

විජේසේකරයන් මෙම ප්‍රතිමාව භික්ෂුවකගේ සිටි රූපය ලෙස හඳුන්වා දෙනු ලැබුවත් බුදු පිළිමයක් යන අර්ථයෙන් ප්‍රතිමාව ගැන විස්තර කර ඇත. මෙම ප්‍රතිමාව ඍජු ඉරියව්වක පිහිටි පිළිමයක් ලෙස ඔහු දක්වන අතර, පෞද්ගලික ස්වභාවයෙහි (හැඟීම් ප්‍රකාශනයේ) මහත් කණගාටුවක් දක්නට නැතත්, ආත්ම සංයමය ප්‍රකාශ කරන බව ඔහුගේ මතයයි (විජේසේකර, 1993). විජේසේකරයන්ගේ මතය වූයේ මෙම ප්‍රතිමාවෙන් ගමනකින් පිඩාවට පත්ව විවේක ගැනීමට පැමිණි බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට යන්තමකට කලින් උන්වහන්සේ සිටි ආකාරය මෙයින් නිරූපණය විය හැකි බව ය (විජේසේකර, 1993).

විජේසේකරයන් විසින් මෙම ප්‍රතිමාව පිළිබඳ වෙනස්ම මතයක් දරන අතර මෙම ප්‍රතිමාවේ මුහුණෙන් ආත්ම සංයමය ප්‍රකට කරවන් බවත් දුක්මුසු බවක් ප්‍රකට නොකරන බව ය. එමඟින් පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව සහ ආනන්ද හිමියන්ගෙන් යැයි දරණ මත සියල්ලම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම ඉරියව්ව පිළිබඳ ඔහු දක්වා ඇති කරුණු පිළිගත නොහැකිය. ඍජු ඉරියව්වක පිහිටා නිර්මාණය කරන ලද ප්‍රතිමාවක් ලෙස ඔහු දක්වා ඇත. එසේම මෙම ප්‍රතිමාවෙන් බුදුන් වහන්සේ නිරූපිත බවත්, පරිනිර්වාණය කිරීම සඳහා කුසිනාරා නුවරට වැඩම කිරීම නිරූපණය කරන බව ය. එම ගමනින් උන්වහන්සේ ලද පීඩාව නිසා පරිනිර්වාණයට පෙර විවේකීව ගත කරන අවස්ථාව ගල් විහාරයේ හිටි ප්‍රතිමාවෙන් නිරූපණය කරන බව ඔහුගේ අදහස බව ප්‍රකාශ කර ඇත. මෙම අදහස තහවුරු කිරීමට අවශ්‍ය කිසිඳු සාධකයක් ඉදිරිපත් නොකරයි. ගමන් විඩාවකින් පැමිණෙන්නෙකු විවේකීව ගත කිරීම සඳහා කිසිඳු අවස්ථාවක හිටි ඉරියව්වක් භාවිත නොකරන බව පැහැදිලි ය. එසේ නම් හිඳි හෝ සැතපෙන ඉරියව්ව එයට වඩාත් උචිත බව පැහැදිලි ය. එම නිසා මෙම මතය ද, ඉතාමත් නිවැරදි අදහසක් ලෙස පිළිගැනීමට නොහැකිය.

කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කරන ලද ඊ. එම්. රත්නපාල ලේඛකයෙක් සහ විවිධ පර්යේෂණවල නියුතු වූ තැනැත්තෙකි. පොළොන්නරුවේ පර්යේෂණවල යෙදුණු ඔහු ඒ සම්බන්ධ ඔහුගේ නිගමනයන් 2000 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. ඔහු විසින් රචිත "අමරණීය පොළොන්නරුව" නම් ග්‍රන්ථයේ ගල් විහාරයේ ප්‍රතිමවාන් පිළිබඳව අදහස් ප්‍රකාශයට පත් කර ඇත.

ඊ. එම්. රත්නපාල මහතාගේ මතයවන්නේ චූලවංශයේ හිටි බුද්ධ ප්‍රතිමාව පිළිබඳ සඳහන් නොවූවත්, වෙනම ප්‍රතිමා ගෘහ හතරක පිළිබඳ සාධක හමුවීමත්, මෙම ප්‍රතිමා සතරෙහිම කලාත්මක ලක්ෂණ අනුව එකම ශෛලීයකට අයත් වන බවත් ඔහුගේ මතයයි. එම නිසා හිටි බුද්ධ ප්‍රතිමාව ඇතුළු සියළුම ප්‍රතිමා එකම කාල සීමාවකට අයත් බව සඳහන් කරයි. එසේම මෙම ප්‍රතිමාව නිසැකවම බුද්ධ ප්‍රතිමාවක් බව ඔහුගේ අදහසවන අතර එයට කරුණු කිහිපයක් දක්වා ඇත. පළමු වැන්න නම් පද්ම පීඨියක් මත ස්ථාපනය කර තිබීමයි. පද්මාසනය යොදා ගනු ලබන්නේ සාමාන්‍යයෙන් බුද්ධ ප්‍රතිමාවලට බව ඔහු ප්‍රකාශ කරන අතර දකුණුපස ඇති ප්‍රතිමාව පරිනිර්වාණ ප්‍රතිමාවක් නොවන්නේ නම් ආනන්ද හිමිගේ යන මතය, තර්කයකින් තොරව බැහැර වන

බව දක්වා ඇත. එසේම ඔත් පිළිමය සහ හිටි ප්‍රතිමාව වෙන් කරන ලද බිත්ති වලින් යුතු ප්‍රතිමා ගෘහ දෙකක් වන බැවින් හිටි ප්‍රතිමාව බුද්ධ ප්‍රතිමාවක් බව තහවුරු වන බව ය.

පී. පී. ඒ. ප්‍රනාන්දු විසින් ලංකා විශ්වවිද්‍යාලය මඟින් ප්‍රකාශයට පත් කරන ලද University of Ceylon Review නම් සඟරාවට ඉදිරිපත් කරන ලද, Tantric Influence on the Sculptures at Gal Vihara, Polonnaruva ලිපියට අනුව ඔහු විසින් මෙම ප්‍රතිමාව තාන්ත්‍රික බලපෑම අනුව නිර්මාණය වූ බවක් ලෙස අර්ථ කථනය කර තිබේ (Fernando, 1960). ඔහුට අනුව, ගල් විහාරයේ ආනන්ද හිමියන්ගේ යැයි සැලකෙන හිටි ප්‍රතිමාව සහ සැතපෙන බුද්ධ ප්‍රතිමාව යැයි ජනප්‍රියව විශ්වාස කරන රූපයන් තාන්ත්‍රික අනුගාමිකයින්ට නමස්කාර සහ භාවනා කිරීම සඳහා භාවිත වූ ප්‍රතිමාවන් ලෙස භාවිත වූ වේද යන්න ප්‍රශ්න සහගත බව ය. මෙම ප්‍රතිමා දෙකෙහිම තාන්ත්‍රික රූප ලෙස හඳුනා ගැනීමට හැකිවන විශේෂ ප්‍රතිමා ලක්ෂණ නොමැති බව සඳහන් කරයි. නමුත් පොදුවේ ප්‍රතිමා සියල්ලම එකට ගත්විට ගල් විහාරයේ මූර්ති සමූහයටම අනුබද්ධ වූ අනිවාර්ය අංගයක් ලෙස දක්වා ඇත. එබැවින් තාන්ත්‍රික ලක්ෂණ කිසිවක් නොමැති වුවද, මෙම හිටි සහ පරිනිර්වාන ප්‍රතිමා දෙක හිඳි ඉරියව්වෙන් යුක්ත බුද්ධ ප්‍රතිමා දෙක සමඟ එක්ව උත්තරාරාමය නම් වූ එක් තාන්ත්‍රික දේවාලයක් සෑදූ බව සැලකිය හැකි බව සඳහන් කරයි. එවිට එය පළමුවන පරාක්‍රමබාහු රජු විසින් තාන්ත්‍රික අනුගාමිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා කරන ලද විශේෂ දායකත්වයක් ලෙස දක්වා ඇත (Fernando, 1960).

**සංසදනාත්මක විග්‍රහය**

මෙම ප්‍රතිමාව මූලික කරගෙන මහාචාර්ය සෙනරත් පරණවිතානයන් මෙම ප්‍රතිමාව පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස අර්ථකථනය කරයි (ලගමුව, 2021). මහාචාර්ය සෙනරත් පරණවිතානයන් මෙම ප්‍රතිමාවෙන් පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව නිරූපිත කරන ලද බව සඳහන් කිරීමට හේතු වූයේ ප්‍රතිමාවේ මුහුණෙන් නිරූපිත දුක්ඛිත ස්වභාවය සහ දෑත් පපුව හරහා තබාගෙන සිටීම පිළිබඳ සැලකිලිමත් වී බව රත්නපාලයන්ගේ අදහස වන්නේ ය. පපුව හරහා දෙඅත් බැඳ මෙම ප්‍රතිමාවේ වම් අතට ඉහළින් දකුණු අත තබාගෙන ඇත. වම් සහ දකුණු අතැඟිලි මඟින් බාහුව ස්පර්ශ කරන ස්වරූපයක් දැකගත හැකිය. නමුත් යටාල වෙහෙර ප්‍රතිමාව හා සංසන්දනය කිරීමේ දී යටාල වෙහෙර ප්‍රතිමාවේ දෑත් මඟින් බාහුව තදින් අල්ලා සිටින බව දැකගත හැකිය. ගල් විහාරයේ හිටි ප්‍රතිමාවේ දෑත් බාහු මත ස්පර්ශවන ලෙස පමණක් දක්වා ඇත. ආභංග ඉරියව් යුක්ත වේ. මෙම ප්‍රතිමාව පද්ම පීඨයක් මත ස්ථාපනය කර තිබීම ද හඳුනාගත හැකිය. එමඟින් මෙම ප්‍රතිමාව නියත වශයෙන් ම බුද්ධ ප්‍රතිමාවක් ලෙස පිළිගැනීමට සිදු වේ. එසේම සෙනරත් පරණවිතානයන් මෙම පිළිමය බුද්ධ ප්‍රතිමාවක් ලෙස සාධක කිහිපයක් ඔස්සේ අර්ථකථනය කර ඇත (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1972).

පී. එල්. ප්‍රේමතිලකගේ මතය වූයේ මෙමගින් අනිමිස ලෝචන පූජාව නිරූපිත බවත්, එබැවින් අනිමිසලෝචන මුද්‍රාව ලෙස හඳුන්වා ඇත. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව දෙවන සතිය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඊසාන දෙසින් වැඩ සිටිමින් ඇසිපිය නොගසමින් බෝධියට කළගුණ සැලකීම මින් නිරූපිත බව ඔහුගේ මතයයි. ගල් විහාරයේ නිසින්න පටිමා ලෙනට ඉදිරියෙන් බෝධිඝරයක සාධක හඳුනාගත හැකිය. එම බෝධිඝරය හිටි බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වූ අවස්ථාවේ දී ම රෝපණය කරන ලද්දක් නම් හිටි බුද්ධ ප්‍රතිමාව ස්ථාපිත දිශාව සමඟ ගෙනහැර බලන කළ බෝධියට ඊසාන දෙසින් හිටි බුද්ධ ප්‍රතිමාව ස්ථාපනයකර ඇති බව හඳුනාගත හැකිය. ඒ අනුව පී. එල්. ප්‍රේමතිලකගේ මතය තහවුරු වන්නේ ය. එසේම පොළොන්නරුව කෞතුකාගාරයේ ඇති මෙම ප්‍රතිමාවට සමාන කවන්ද බුද්ධ ප්‍රතිමාව හමු වී ඇත්තේ ද කුරුප්පු හන්දිය බෝධිය අසලින් ය. එමඟින් ද මෙම කරුණ තහවුරු කළ හැකිය. පසුකාලීනය හමුවන සිතුවම් අතර මෙම මුද්‍රාව යොදාගෙන ඇත්තේ ද, සත් සතියේ දෙවන සතිය නිරූපණය කිරීම සඳහා ය. එසේම මෙම මුද්‍රාව පිළිබඳව කඹුරුපිටියේ වනරතන හිමි සහ රෝලන්ඩ් ද සිල්වා විසින් ද අදහස් දක්වා ඇත.

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මතය වූයේ මෙම මුද්‍රාව අවධාන මුද්‍රාව ලෙස ය. ගල්විහාරයේ ප්‍රතිමාවේ මුහුණෙන් අවධානය ප්‍රකාශ කරවන මුහුණුවරක් නිරූපණයවන බැවින් එම හේතුවෙන් මෙය අවධාන මුද්‍රාව ලෙස අර්ථ කථනය කරයි.

ගුණපාල සේනාධීර සහ මහාචාර්ය විමල විජයසූරිය ප්‍රකාශ කරනු ලබන්නේ මෙය ස්වස්තික මුද්‍රාව බව ය. අර්නස්ට් ඩේල් සෝන්ඩර්ස් විසින් ගල් විහාරයේ හිටි ප්‍රතිමාවේ දෑත් තබා ඇති ස්වරූපය අනුව එයින් මහාප්‍රඥපාරමිතා මුද්‍රාව නියෝජනය කරන බව සඳහන් කරයි.

ඉහත කී අදහස්වලට අමතරව මෙම මුද්‍රාව සඳහා විවිධ නාමයන් ඉදිරිපත් වී ඇත. කඹුරුපිටියේ වනරතන හිමියන් විසින් ත්‍රෛලෝක්‍ය විජයා මුද්‍රාව ලෙස ද, ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ විසින් ධර්ම සම්මර්ශන

මුද්‍රාව/රතනසර මුද්‍රාව ලෙස ද, ඩී. ටී. දේවේන්ද්‍ර විසින් ගෞරව සාවධාන ශ්‍රවණාකල්ප මුද්‍රාව ලෙස ද, චන්ද්‍ර වික්‍රමගමගේ වජ්‍රහුංකාර මුද්‍රාව ලෙස ද, තම මතයන් දක්වා ඇත.

සෙනරත් පරණවිතාන, චන්ද්‍රා වික්‍රමගමගේ, ආරිය ලගමුව, නන්දදේව විජේසේකර, ඊ. එම්. රත්නපාලයන්ගේ මතය වූයේ මෙම හිටි ප්‍රතිමාව මඟින්, බුදුරාජාණන් වහන්සේ ව නිරූපණය කරන ලද බව ය.

මෙම ප්‍රතිමාව එස්. එම්. බරොස් විසින් මෙම ප්‍රතිමාව මුලින්ම ආනන්ද හිමියන්ගේ ප්‍රතිමාවක් බව සඳහන් කර ඇත. ඩී. ටී. දේවේන්ද්‍ර විසින් ද මෙම ප්‍රතිමාව ආනන්ද හිමියන්ගේ බවත්, බුදුන්ගේ පිරිනිවනින් කම්පා වන අවස්ථාව නිරූපණය කරන ලද බවත් සඳහන් කරයි. නමුත් දැනට මෙම මතය විවාදයට ලක් වී ඇත. ඉහත කී කාරණය තහවුරුවන එකම නිදර්ශන සහිත ස්ථානය ලෙස මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ නිර්මාණය වූ නියඳවනය පුරාණ රජමහා විහාරයේ පළමු ලෙන් පිළිමගෙයි ඇති සිතුවම් දැක්විය හැකිය. නමුත් කාලානුරූපීව සමාන නොවන බැවින් මෙම ස්ථාන දෙක සමාන අර්ථයන්ගෙන් යුක්තව විග්‍රහා කළ නොහැකිය. නියඳවනය විහාරයේ සිතුවම් අතර බුද්ධ පරිනිර්වානය සහ බුද්ධ ආදාහන පූජෝත්සවය නිරූපිත අවස්ථාවේ දී බුදුන් පාමුල ආන්නද හිමියන් මෙම මුද්‍රාවෙන් යුක්තව නිරූපණය කර තිබීම දැකගත හැකිය. නමුත් බහුතර විද්වත් මතය වූයේ මෙය බුද්ධ ප්‍රතිමාවක් බවත් ආනන්ද තෙරුන්ගෙන් නොවන බවත් ය.

**නිගමනය**

පර්යේෂණයේ නිදර්ශන පිළිබඳ පොදුවේ ගත් කල ප්‍රධාන අර්ථ තුනකින් ප්‍රතිමා නිර්මාණය වන්නට ඇති බව හඳුනාගත හැකිය. පළමු වැන්න නම් බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයින් කෙරෙහි කරුණාවෙන් යුක්තව බලන ස්වරූපයෙන් යන අර්ථයෙන් යුක්තව බුද්ධ ප්‍රතිමාවක් ලෙස නිර්මාණය වූ බව ය. දෙවැන්න නම් බුද්ධත්වයෙන් පසුව සත්සතියේ දෙවන සතිය වූ අනිමිසලෝචන පූජාව නිරූපණය කිරීමට යොදාගත් බව ය. තෙවන අර්ථය නම් බුද්ධ පරිනිර්වාණයෙන් ශෝකයට පත් ආනන්ද තෙරුන් නිරූපණය කරන ලද බව ය. මෙම පර්යේෂණයට අනුව හමු වී ඇති කරුණු අනුව මෙම ප්‍රතිමාව රූපභේද අතින් නියත වශයෙන්ම ප්‍රතිමාව බුද්ධ ප්‍රතිමාවක් බව ය. නමුත් අර්ථකථනයන් සහ වෙනත් සාධක අනුව ආනන්ද තෙරුන්ගේ ප්‍රතිමාවක් ලෙස ද හඳුනාගත හැකි නමුත් දුර්වල සාධකයන් බැවින් ආනන්ද හිමියන්ගේ යන අර්ථය පිළිගත නොහැකි බව ය. එසේ ම මෙම ප්‍රතිමාවන් භාවිත කර තිබෙන්නේ වන්දනාමාන කිරීම අරමුණු කරගෙන ය. ඉහත සාධක විශ්ලේෂණයෙන් පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව සහිත ප්‍රතිමාවන් බුදුරජාණන් වහන්සේව නිරූපණය සඳහා යොදාගත් බවත්, මහනුවර යුගයේ විහාර බිතුසිතුවම් හි නිරූපිත පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව බුද්ධත්වයෙන් පසු සත් සතියේ දෙවන සතිය නිරූපණය සඳහාත් යොදා ගෙන ඇති බව පැහැදිලි ය. එම නිසා පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව පිළිබඳව පළ වී ඇති මත සියල්ලම පාහේ ඉහත නිදර්ශකයන්ගෙන් තහවුරු වී ඇත. මෙම නිසා මෙම මුද්‍රාව එක්තරා දුරකට සුවිශේෂී මුද්‍රාවක් ලෙස අර්ථකථනය කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ආරියපාල, බී. කේ. (2008), *ලක්දිව බුදු පිළිම.* අකුර පොත් ප්‍රකාශකයෝ.

උපරතන, වී. (2011) *මූර්තියෙන් මූර්තිමත් බුද්ධ.* සූරිය ප්‍රකාශකයෝ.

ඤාණවිමල, කේ. (සංස්.) (1951) *පූජාවලිය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මදස්සි, ඩී. (2010), *ශ්‍රී ලංකේය බුද්ධ ප්‍රතිමා ලක්ෂණ*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පියදස්සි, එච්. සහ ගුණසිංහ, එච්. සී. (2017) *කෝසල බිම්බ වර්ණනාව.* සූරිය ප්‍රකාශකයෝ.

පොන්සේකා, ප්‍ර. (2019) *දීපවංසය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත, පී. (1962) *ධම්මපදය.* සමන් ප්‍රකාශකයෝ.

බෝපෙආරච්චි, ඔ. සහ ගුණවර්ධන, න. (2022) *බුද්ධත්වයෙන් පසු සත්සතිය මහනුවර යුගයේ බිතු සිතුවම් ඇසුරින්.* පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව.

රාජශෙඛර, ඊ. ඇස්. (2015) *දළදා සිරිත.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලගමුව, ඒ. (2021) *මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව.* සී/ස සරසවි ප්‍රකාශකයෝ.

වික්‍රමගමගේ, සී. (2006) *ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

වික්‍රමගමගේ, සී. (2011) *පොළොන්නරුවේ ගල් විහාරය.* කර්තෘ ප්‍රකාශනයකි.

විජයසූරිය, වී. (1996) 'සිංහල බුද්ධ ප්‍රතිමාව සහ ස්වස්තික මුද්‍රාව', ධම්මපාල හිමි, ජී. සහ අරංගල, ආර්. (සංස්.) *කඹුරුපිටියේ වනරතන මාහිමි අභිස්තව සංග්‍රහය.* සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව. පි. 17-40.

විජේසේකර, එන්. (2015) *පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. (1972). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*

(ආටිගල, එන්., ලබ්රෝයි, ඩබ්ලිව්. ජේ. එෆ්., නටේසන්, එස්., නිකලස්, සී. ඩබ්ලිව්., සහ පරණවිතාන, එස්. (සංස්.). විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

විමලජෝති, කේ. (සංස්.) (2003) *මහාවංශය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Bhikkhu, A. (Ed.). (2020). *The Nidanakatha, or Introduction to the Jataka from Buddhist Birth Stories* (T. W. R. Davids, Trans.). https://www.holybooks.com/wp-content/uploads/The-Nidanakatha.pdf (Original work published 1880)

Devendra, D. T. (1956). The Standing Figure at the Gal Vihara, Polonnaruwa. *Sir Paul Pieris Felicitation Volume*.

Fernando, P. E. E. (1960). Tantric Influence on the Sculptures at Gal Vihara, Polonnaruva. *University of Ceylon Review*, *January - April 1960*.

Jones, J. J. (1956). *The Mahavastu* (Vol. III). Luzac & Company LTD.

Prematilleke, L. (1966). The Identity and Significance of the Standing Figure at the Gal-vihara. *Artibus Asiae*, *28*(1), 61–66. https://doi.org/10.2307/3249317